තාක්ෂණ අමාත්‍යාංශය தொழில்நுட்ப அமைச்சு MINISTRY OF TECHNOLOGY

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ஆட்களைப் பதிவு செய்யும் திணைக்களம்
DEPARTMENT FOR REGISTRATION OF PERSONS
10th Floor, Suhurupaya, Sri Subhuthipura rd, Battaramulla.

My Ref: DRP/OP/01/Office Order/12 | Your Ref: | Date: 2021.07.

"Identity Card, the Trusted Personal Identity"

**චක්‍රලේඛ අංක 02/2021**

දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයේ සියලුම නිලධාරීන් වෙත,

**<u>ජාතික හැඳුනුම්පතට නම ඇතුළත් කිරීම සම්බන්ධව උපදෙස්</u>**

ඉහත කරුණට අදාළ මගේ සමාංක හා 2018.11.30 දිනැති උපදෙස් ලිපිය මෙයින් අවලංගු කරන අතර, ඒ වෙනුවට 2021.08.01 දින සිට මෙම චක්‍රලේඛයේ උපදෙස් පමණක් ක්‍රියාත්මක කළ යුතු බවත්, ඒ අනුව ජාතික හැඳුනුම්පතට නම ඇතුළත් කිරීමේ දී පහත උපදෙස් අනුව කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

## 1. උප්පැන්න සහතිකය අනුව නම ලබාදීම.

**1.1.** හැඳුනුම්පතට නම ලබා දීමේදී උප්පැන්න සහතිකයට අමතරව උප්පැන්න සහතිකයෙන් උපුටාගත් සටහන, අනුමාන වයස් සහතිකය, දරුකමට හදාගැනීමේ සහතිකය, හිස් ප්‍රතිඵල ලේඛනය හා වතු උප්පැන්න සහතිකය යන ලේඛනද පාදක ලේඛන ලෙස සැලකිය හැකි වේ.

**උදා:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම : කසුන් සමීර**
**පියාගේ නම : අබේසිංහ ආරච්චිගේ සරත් කුමාර සිරිවර්ධන**

1.1.1. උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ ඇති නම පමණක් ලබාදීම (පෙළපත් නාමය හෝ වාසගම රහිතව නම ඉල්ලුම් කරන විට).
**උදා:- කසුන් සමීර**

1.1.2. පෙළපත් නාමය සහිතව දෙවන තීරුවේ නම ලබාදීම.
**උදා:- අබේසිංහ ආරච්චිගේ කසුන් සමීර**

1.1.3. වාසගම පමණක් සහිතව දෙවන තීරුවේ නම ලබාදීම.
**උදා:- කසුන් සමීර සිරිවර්ධන**

1.1.4. පෙළපත් නාමය හා වාසගම යන කොටස් දෙකම සහිතව දෙවන තීරුවේ නම ලබාදීම.
**උදා:-අබේසිංහ ආරච්චිගේ කසුන් සමීර සිරිවර්ධන**

**1.2.** උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ සඳහන් සම්පූර්ණ නම අනිවාර්යයෙන් ලබාගත යුතුය. වෙනස් ආකාරයකට ඉල්ලන්නේ නම් උප්පැන්න සහතිකය සංශෝධනය කර ගත යුතුය.

**උදා:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම : අබේසිංහ ආරච්චිගේ සමීර සම්පත් සිරිවර්ධන**
**පියාගේ නම : අබේසිංහ ආරච්චිගේ නිහාල් සිරිවර්ධන**
**ඉල්ලන නම : සමීර සම්පත් සිරිවර්ධන/ අබේසිංහ ආරච්චිගේ සමීර සම්පත්**
**ලබාදිය හැකි නම : අබේසිංහ ආරච්චිගේ සමීර සම්පත් සිරිවර්ධන**

Phone (011) 5226100 | Fax (011) 2862198 | E-mail info@drp.lk | Web www.drp.gov.lk

Scanned with CamScanner

1.3. දෙවැනි තීරුවේ නම මුලකුරු සහිතව දක්වා ඇති අවස්ථාවකදී එම මුලකුරුවලින් කියවෙන පෙළපත් නාමය පියාගේ හෝ මුත්තාගේ නමින් හෝ දැනුම් දෙන්නාගේ (උපන්ගෙයි පදිංචිකරු) නමින් විස්තර වන්නේ නම් හා එම පෙළපත් නාමය අයදුම්කරු ඉල්ලනු ලබන්නේ නම් ඒ අනුව නම ලබා දිය යුතුය.

| | |
|---|---|
| **උදා:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම** | **: ඒ. ඒ. කසුන් සමීර** |
| **පියාගේනම** | **: අබේසිංහ ආරච්චිගේ සරත් කුමාර සිරිවර්ධන** |
| **මුත්තාගේ නම** | **: අබේසිංහ ආරච්චිගේ සිරිවර්ධන** |
| **දැනුම් දෙන්නාගේ නම** | **: අබේසිංහ ආරච්චිගේ සරත් කුමාර සිරිවර්ධන** |
| **ඉල්ලන නම** | **: අබේසිංහ ආරච්චිගේ කසුන් සමීර සිරිවර්ධන** |
| **ලබාදිය හැකි නම** | **: අබේසිංහ ආරච්චිගේ කසුන් සමීර සිරිවර්ධන** |

1.4. අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ පියාගේ නම හා මුත්තාගේ නම සඳහන්ව ඇත්තේ පෙළපත් නාමය මුලකුරුවලින් පමණක් නම් අයදුම්කරු පෙළපත් නාමය ඉල්ලා සිටින විට,

| | |
|---|---|
| **උදා:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම** | **: කසුන් සමීර** |
| **පියාගේ නම** | **: ඒ.ඒ.සරත් කුමාර සිරිවර්ධන** |
| **මුත්තාගේ නම** | **: ඒ.ඒ.සිරිවර්ධන** |
| **ඉල්ලන නම** | **: අබේසිංහ ආරච්චිගේ කසුන් සමීර** |

<u>නම ලබාදෙන ආකාරය</u>

අ. පළමුවරට නම් උප්පැන්න සහතිකය සංශෝධනය කර ඉල්ලුම් කිරීමට උපදෙස් ලබා දීම.

ආ. ඉල්ලන නම පෙර භාවිතා කර ඇත්නම් මෙහි 6.1 වගන්තියේ පරිදි ලබාදිය හැකිය.

1.5. උප්පැන්න සහතිකයේ පියාගේ හෝ මුත්තාගේ පෙළපත් නාමය හෝ වාසගම සඳහන් නොමැති අවස්ථාවලදී අයදුම්කරු පෙළපත් නාමය ඉල්ලා සිටින අවස්ථාවල දී,

| | |
|---|---|
| **උදා:-උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම** | **: කසුන් සමීර** |
| **පියාගේ නම** | **: සරත් කුමාර සිරිවර්ධන** |
| **මුත්තාගේ නම** | **: සිරිවර්ධන** |
| **ඉල්ලන නම** | **: අබේසිංහ ආරච්චිගේ කසුන් සමීර** |

<u>නම ලබාදෙන ආකාරය</u>

අ. පළමු වරට ඉල්ලන්නේ නම් උප්පැන්න සහතිකය සංශෝධනය කර ඉල්ලුම් කිරීමට උපදෙස් ලබා දීම.

ආ. ඉල්ලන නම පෙර භාවිතා කර ඇත්නම් මෙහි 6.1 වගන්තියේ පරිදි කටයුතු කළ හැකිය.

1.5.1. අයදුම්කරු ඉල්ලා සිටින පෙළපත් නාමය හෝ වාසගම මුත්තාගේ තීරුවේ සඳහන් වී ඇත්නම් එය ලබා දිය හැකිය.

| | |
|---|---|
| **උදා:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම** | **: කසුන් සමීර** |
| **පියාගේ නම** | **: සරත් කුමාර** |
| **මුත්තාගේ නම** | **: අබේසිංහ ආරච්චිගේ සිරිපාල** |
| **ඉල්ලන නම** | **: අබේසිංහ ආරච්චිගේ කසුන් සමීර** |
| **ලබාදිය හැකි නම** | **: අබේසිංහ ආරච්චිගේ කසුන් සමීර** |

1.6. උප්පැන්න සහතිකයේ පියාගේ පෙළපත් නාමය හෝ වාසගම සඳහන්ව ඇතත්, අයදුම්කරු විසින් මුත්තාගේ තීරුවේ පෙළපත් නාමය හෝ වාසගම ඉල්ලා සිටින විට, එකී නාමය පහත ලෙස ලබාදිය හැකිය. (සියලුම අයදුම්කරුවන් සඳහා)



Scanned with CamScanner

1.6.1. පියාගේ නමත් මුත්තාගේ නමත් අතර සුළු වෙනස්කම් පවතින විට,

**උදා:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම : කසුන් සමීර**
**පියාගේ නම : අබේසිංහ ආරච්චිගේ සරත් කුමාර සිරිවර්ධන**
**මුත්තාගේ නම : අබේසිංහ ආරච්චිලාගේ පියදාස**
**ඉල්ලන නම : අබේසිංහ ආරච්චිලාගේ කසුන් සමීර සිරිවර්ධන**
**ලබාදිය හැකි නම : අබේසිංහ ආරච්චිලාගේ කසුන් සමීර සිරිවර්ධන**

1.6.2. උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ පියාගේ නම මුලට හෝ අගට ඇතුළත්ව ඇති විට ඒ අයුරින් නම ලබාදිය හැක. ඉහත 1.6.1 හි සඳහන් නම ලබා දීමේ ක්‍රමයට ව්‍යාතිරේකව පියාගේ නම වෙනුවට මුත්තාගේ නමත් සමඟ පියාගේ නම වාසගම ලෙස ඉල්ලා ඇති විටක එම නම ලබාදිය හැකිය.

**උදා:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම : නසීර්**
**පියාගේ නම : හමීඩ් මොහමඩ්**
**මුත්තාගේ නම : අහමඩ් හමීඩ්**
**ඉල්ලන නම : හමීඩ් මොහමඩ් නසීර්**
**ලබාදිය හැකි නම : හමීඩ් මොහමඩ් නසීර්**

1.6.3. යම් අවස්ථා වල පියාගේ නම දරුවාගේ නමේ අගට ඉල්ලා ඇත්නම් එය ලබාදිය හැකිය.

**උදා 1:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම : නසීර්**
**පියාගේ නම : හමීඩ් මොහමඩ්**
**ඉල්ලන නම : නසීර් මොහමඩ්**
**ලබාදිය හැකි නම : නසීර් මොහමඩ්**

**උදා 2:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම : දිලිප්කුමාර්**
**පියාගේ නම : කන්දසාමි විජයකුමාර්**
**මුත්තාගේ නම : නඩරාජා කන්දසාමි**
**ඉල්ලන නම : විජයකුමාර් දිලිප්කුමාර්**
**දිලිප්කුමාර් විජයකුමාර්**
**දිලිප්කුමාර් කන්දසාමි**
**කන්දසාමි දිලිප්කුමාර්**
**නඩරාජා දිලිප්කුමාර්**
**නඩරාජා කන්දසාමි දිලිප්කුමාර්**
**කන්දසාමි විජයකුමාර් දිලිප්කුමාර්**
**ලබාදිය හැකි නම : ඉහත ඉල්ලා ඇති සෑම ආකාරයටම ලබාදිය හැකිය.**

1.6.4. දෙවන තීරුවේ සඳහන් නමට අමතරව ඉල්ලන නම් කොටස්, උප්පැන්න සහතිකයේ පියාගේ හෝ මුත්තාගේ නමේ සඳහන් විය යුතුය. පියාගේ නමත් මුත්තාගේ නමත් සම්පූර්ණයෙන්ම වෙනස්ව ඇති විට, ඉල්ලන නම පෙර භාවිතා කර ඇත්නම් 6.1 වගන්තියේ උපදෙස් අනුව ලබාදිය හැකිය.

**1.7.** අයදුම්කරු පියාගේ නම ඉදිරියට හා පිටුපසට ඉල්ලුම් කිරීමේදී,

1.7.1. සිංහල අයදුම්කරුවන් සඳහා නම ලබාදීමේදී අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ පියාගේ නම පහත පරිදි සඳහන් වේ නම්,



Scanned with CamScanner

උදා 1:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම : කසුන් සමීර
පියාගේ නම : අබේසිංහ ආරච්චිගේ සිරිපාල
ලබාදිය හැකි නාම : අබේසිංහ ආරච්චිගේ කසුන් සමීර
අබේසිංහ ආරච්චිගේ කසුන් සමීර සිරිපාල
කසුන් සමීර සිරිපාල

උදා 2:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම : කසුන් සමීර
පියාගේ නම : කිරිබණ්ඩාගේ නිමල්සිරි
ලබාදිය හැකි නාම : නිමල්සිරිගේ කසුන් සමීර
කිරිබණ්ඩාගේ නිමල්සිරිගේ කසුන් සමීර
කසුන් සමීර නිමල්සිරි
කිරිබණ්ඩාගේ කසුන් සමීර නිමල්සිරි

1.7.2. උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම සමග උප්පැන්න සහතිකයේ සඳහන් පියාගේ සම්පූර්ණ නම හෝ ඉන් කොටසක් දෙවන තීරුවේ නමෙහි ඉදිරිපසට හෝ පිටුපසට ලබාදිය හැකිය.(සියලුම ජනවර්ග සඳහා)

උදා 1:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම : සමීර සම්පත්
පියාගේ නම : විතාරණගේ සුමනදාස
ඉල්ලන නම : සමීර සම්පත් විතාරණගේ
විතාරණගේ සුමනදාස සමීර සම්පත්
සමීර සම්පත් විතාරණගේ සුමනදාස
විතාරණගේ සමීර සම්පත් සුමනදාස
සමීර සම්පත් විතාරණ
ලබාදිය හැකි නාම : ඉහත ඉල්ලා ඇති සෑම ආකාරයටම ලබාදිය හැකිය.

උදා 2:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම : දිලිප්කුමාර්
පියාගේ නම : කන්දසාමි විජයකුමාර්
ඉල්ලන නම : විජයකුමාර් දිලිප්කුමාර්
කන්දසාමි දිලිප්කුමාර්
දිලිප්කුමාර් විජයකුමාර්
දිලිප්කුමාර් කන්දසාමි
ලබාදිය හැකි නාම : ඉහත ඉල්ලා ඇති සෑම ආකාරයටම ලබාදිය හැකිය.

උදා 3 :- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම : මොහමඩ් ඉර්ෂාන්
පියාගේ නම : මොහමඩ් නසීර් මොහමඩ් ආබදීන්
ඉල්ලන නම : මොහමඩ් ඉර්ෂාන් ආබදීන්
මොහමඩ් ඉර්ෂාන් මොහමඩ් ආබදීන්
ලබාදිය හැකි නාම : ඉහත ඉල්ලා ඇති සෑම ආකාරයටම ලබාදිය හැකිය.

උදා 4 :- උප්පැන්න ස .තිකයේ දෙවන තීරුවේ නම : අභිෂේක්
පියාගේ නම : නඩරාජන් සිවබාලන්
ඉල්ලන නම : අභිෂේක් සිවබාලන්
ලබාදිය හැකි නාම : අභිෂේක් සිවබාලන්

1.7.3. ඉහත ආකාරයට වඩා වෙනස් ආකාරයට නම ඉල්ලා ඇතිවිට, ඉල්ලන නම පෙර භාවිතා කර ඇත්නම් මෙහි 6.1 වගන්තියේ උපදෙස් අනුව ලබාදිය හැකිය.



Scanned with CamScanner

**1.8.** උප්පැන්න සහතිකයේ පියාගේ තොරතුරු ඇතුළත්ව නොමැති විට,

1.8.1. උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ ඇති නම පමණක් ඉල්ලා ඇති විට එකී නම ලබාදීම.

1.8.2. මවගේ පෙළපත් නාමය හෝ වාසගම ඉල්ලා සිටින විට එම කොටස් දෙක සහිතව හෝ එක කොටසක් සහිතව ඉල්ලා සිටින ආකාරය අනුව නම ලබාදීම.

1.8.3. උප්පැන්න සහතිකයේ දැනුම් දෙන්නාගේ තීරුවේ සඳහන් නම ඉල්ලා සිටින විට උපන් ගෙයි පදිංචිකරු වශයෙන් දැනුම් දෙන්නා සඳහන් කර ඇති විට එම නම ලබාදීම.

**1.9.** උප්පැන්න සහතිකයේ පියාගේ තොරතුරු ඇතුළත්ව ඇතත් දෙමව්පියන් විවාහ වී නොමැති බව සඳහන් කර ඇති විට,

1.9.1. ඉල්ලුම්කරු ඉල්ලා සිටින විට පියාගේ වාසගම හෝ පෙළපත් නාමය ලබාදිය හැකිය.

1.9.2. ඉල්ලුම්කරු ඉල්ලා සිටින විට මවගේ වාසගම හෝ පෙළපත් නාමය ලබාදිය හැකිය.

1.9.3. ප්‍රාදේශීය ව්‍යවහාර අනුව අයදුම්කරුවන් විසින් නම ඉල්ලා සිටින විට මවගේ නමෙහි අගට"ගේ"යොදා උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ ඇති නමට මුලින් ලබාදිය හැකිය.

1.9.4. පියාගේ නම ලබාදීමේ ආකාරයන්ට අනුවම මවගේ නමද දරුවාට ලබාදිය හැකිය.

| | |
|---|---|
| **උදා:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම** | **: කසුන් සමීර** |
| **පියාගේ නම** | **: අබේසිංහ ආරච්චිගේ සරත් කුමාර** |
| **මවගේ නම** | **: පතිරණගේ කමලාවතී** |
| **ඉල්ලන නම** | **: අබේසිංහ ආරච්චිගේ කසුන් සමීර**<br>**පතිරණගේ කසුන් සමීර**<br>**කමලාවතීගේ කසුන් සමීර** |
| **ලබාදිය හැකි නම** | **: ඉහත ඉල්ලා ඇති සෑම ආකාරයටම ලබාදිය හැකිය.** |

**1.10.** දෙමාපියන් විවාහක නම් මවගේ නම හෝ වාසගම ලබාදිය නොහැකිය. පෙර හැඳුනුම්පතේ භාවිතා කර ඇත්නම් මෙහි 6.1 වගන්තියේ උපදෙස් අනුව ලබාදිය හැකිය.

**1.11.** ප්‍රාදේශීය ව්‍යවහාර අනුව නම ලබා දීමේ සම්ප්‍රදාය අනුව පියාගේ නම, <u>ගේ</u> සහිතව දරුවාගේ දෙවන තීරුවේ නමට මුලින් යොදා නම ලබා දීම සිදු කෙරේ. එසේම එලෙස ඉල්ලා නොමැති විට සාමාන්‍ය ක්‍රමය අනුව නම ලබාදිය හැකිය. (නම ලබා දීමේදී පියාගේ හෝ මුත්තාගේ පෙළපත් නාමය සැලකිය හැකිය)

| | |
|---|---|
| **උදා:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම** | **: කසුන් සමීර** |
| **පියාගේ නම** | **: සිරිපාලගේ සරත් කුමාර** |
| **මුත්තාගේ නම** | **: පුංචිරාලගේ සිරිපාල** |
| **ඉල්ලන නම** | **: සරත් කුමාරගේ කසුන් සමීර** |
| **ලබාදිය හැකි නම** | **: සරත් කුමාරගේ කසුන් සමීර** |

**1.12.** ඇතැම් ප්‍රදේශවල ඊට ආවේණික සම්ප්‍රදායික ක්‍රමවේද මත නම ලබාගන්නා අවස්ථා දැකිය හැකිය.

1.12.1. මහනුවර දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශවල මුස්ලිම් සම්භවයක් ඇති පුද්ගලයන් සිංහල පෙළපත් නාමය සහිතව පියාගේ වාසගමද ඇතුලත්ව නම ඉල්ලුම් කරනු ලබන විට,

| | |
|---|---|
| **උදා:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම** | **: නසීර්** |
| **පියාගේ නම** | **: ඉහලපැලේ රාළහාමිගේ මොහමඩ් කරීම්** |
| **ඉල්ලන නම** | **: ඉහලපැලේ රාළහාමිගේ කරීම් නසීර්** |
| **ලබාදිය හැකි නම** | **: ඉහලපැලේ රාළහාමිගේ කරීම් නසීර්** |



Scanned with CamScanner

1.12.2. ගම්පහ දිස්ත්‍රික්කයේ කටාන ප්‍රදේශයේ නම් ලබාදීමේදී පහත පරිදි නම ලබාගන්නා අවස්ථා දැකිය හැකිය. එවන් අවස්ථා වලදී පියා නම ලබාගෙන ඇති රටාවට අනුකූලව දරුවා නම ලබාගන්නේ නම් පහත පරිදි නම ලබාදිය හැකිය.

| | |
|---|---|
| **උදා:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම** | **: සමන් කුමාර** |
| **පියාගේ නම** | **: ජෝසප් රොෂාන් ප්‍රනාන්දු ජූඩ් පුල්ලේ** |
| **මුත්තාගේ නම** | **: ජූඩ් නිරෝෂාන් ප්‍රනාන්දු ඇන්ටනී පුල්ලේ** |
| **ඉල්ලන නම** | **: සමන් කුමාර ප්‍රනාන්දු ජෝසප් පුල්ලේ** |
| **ලබාදිය හැකි නම** | **: සමන් කුමාර ප්‍රනාන්දු ජෝසප් පුල්ලේ** |

1.12.3. පහත ආකාරයට නම් ඉල්ලුම් කර ඇතිවිට, උප්පැන්න සහතිකයට අනුව පියාගේ හා මුත්තාගේ නම් සළකා බැලීමෙන් අනතුරුව, පරම්පරාවෙන් පරම්පරාවට භාවිතා කරන ආකාරය සනාථ වන්නේ නම් ඉල්ලන නම ලබාදිය හැකිය.

| | |
|---|---|
| **උදා:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම** | **: කසුන් සමීර** |
| **පියාගේ නම** | **: නිමල් ඩේවිඩ් සිරිසේන** |
| **මුත්තාගේ නම** | **: ජාසින් ඩේවිඩ් සුමනදාස** |
| **ඉල්ලන නම** | **: කසුන් ඩේවිඩ් සමීර** |
| **ලබාදිය හැකි නම** | **: කසුන් ඩේවිඩ් සමීර** |

## 2. විවාහයෙන් පසුව ස්වාමිපුරුෂයාගේ නම ලබාදීම.

විවාහ සහතිකයේ මුල් පිටපතේ සඳහන් ආකාරයට පහත දැක්වෙන පරිදි නම ලබා දිය හැකිය.

**2.1.** සියලුම ජනවර්ග සඳහා, අයදුම්කාරියගේ පියාගේ පෙළපත හෝ වාසගම සහිතව හෝ රහිතව ස්වාමිපුරුෂයාගේ නම හෝ වාසගම ලබාදිය හැකිය.

**2.2.** අයදුම්කාරියගේ උප්පැන්න සහතිකයේ දෙවැනි තීරුවේ නම තුළ පියාගේ වාසගම ඇතුළත්ව ඇත්නම් එම කොටස පියාගේ වාසගම බව පැහැදිලිව හඳුනාගත හැකි නම් එය ඉවත් කර ස්වාමිපුරුෂයාගේ නම/ වාසගම යෙදීම.(අයදුම්කරුගේ පෙළපත් නාමය සහිතව හෝ රහිතව)

**2.3.** කිසිදු අවස්ථාවක ස්වාමිපුරුෂයාගේ පෙළපත් නාමය ලබා ගත නොහැකිය.

**2.4.** ස්වාමිපුරුෂයාගේ පෙළපත් නාමය පෙර හැඳුනුම්පතේ භාවිතා කර ඇත්නම් මෙහි 6.1 වගන්තියේ උපදෙස් අනුව ලබාදිය හැකිය.

**2.5.** ස්වාමිපුරුෂයාගේ නම භාවිතා කර නැවත මුලින් භාවිතා කළ නම (පියාගේ පෙළපත් නම වාසගම සහිතව) ඉල්ලා සිටී නම් දික්කසාදය පිළිබඳව අධිකරණ නියෝගය/ මරණ සහතිකය හෝ අතුරුදන් වීමේ සහතිකය තිබිය යුතුය. ඉහත සඳහන් පරිදි ස්වාමිපුරුෂයාගේ මරණයක් හෝ වෙන්වීමක් හෝ අත්හැර යාමක් නොමැති අවස්ථාවක නැවත මුල් නම (පියාගේ පෙළපත් නම හෝ වාසගම සහිතව) ලබා ගැනීමට අවශ්‍ය නම් දිවුරුම් ප්‍රකාශයක් මගින් නැවත ස්වාමිපුරුෂයාගේ වාසගම ලබා නොගන්නා බවට තහවුරු කිරීමෙන් අනතුරුව පියාගේ පෙළපත් නම/ වාසගම ලබා ගත හැකිය.

**2.6.** විවාහය විදේශයකදී හෝ පල්ලියකදී හෝ කෝවිලකදී හෝ සිදුකිරීමෙන් පසු නිකුත් කරනු ලබන සහතික විවාහය සිදු වූ බවට ලිඛිත ලියවිල්ලක් ලෙස භාරගත හැකිය.



Scanned with CamScanner

2.7. අයදුම්කාරියගේ විවාහ සහතිකය දිරාපත් වීම හේතුවෙන් ගනු ලබන හිස් ප්‍රතිඵල ලේඛනය සමඟ දරුවන්ගේ උප්පැන්න සහතිකයක් හා විධිමත් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම මඟින් ස්වාමිපුරුෂයාගේ නම/ වාසගම ලබා ගත හැකිය.

2.8. විවාහය ලිඛිතව තහවුරු කළ නොහැකි විට උප්පැන්න සහතිකයේ නාම පමණක් ලබාදීම.

**උදා 1:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම : රත්නායකගේ කසුනි සිරිවර්ධන**
**පියාගේ නම : රත්නායකගේ නිමල් සිරිවර්ධන**
**ස්වාමිපුරුෂයාගේ නම : හේරත්ගේ සමීර සම්පත් හේරත්**
**ඉල්ලන නම : රත්නායකගේ කසුනි සිරිවර්ධන හේරත්**
**කසුනි සිරිවර්ධන හේරත්**
**කසුනි හේරත්**
**රත්නායකගේ කසුනි හේරත්**
**ලබාදිය හැකි නම : ඉහත ඉල්ලා ඇති සෑම ආකාරයටම ලබාදිය හැකිය.**

**උදා 2:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම : නිශාන්දිනී**
**පියාගේ නම : මුත්තුසාමි**
**ස්වාමිපුරුෂයාගේ නම : සිවකුමාර් ජීවානන්දන්**
**ස්වාමිපුරුෂයාගේ පියාගේ නම : රාමසාමි සිවකුමාර්**
**ඉල්ලන නම : නිශාන්දිනී ජීවානන්දන්**
**මුත්තුසාමි නිශාන්දිනී ජීවානන්දන්**
**ලබාදිය හැකි නම : ඉහත ඉල්ලා ඇති සෑම ආකාරයටම ලබාදිය හැකිය.**

**උදා 3:- උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ නම :පාතිමා නිෆ්ලා**
**පියාගේ නම : මොහමඩ් ෆවුසි**
**ස්වාමිපුරුෂයාගේ නම : මොහමඩ් ජිෆ්රි අහමඩ් රිස්වාන්**
**ස්වාමිපුරුෂයාගේ පියාගේ නම : මොහමඩ් නසීර් මොහමඩ් ජිෆ්රි**
**ඉල්ලන නම : පාතිමා නිෆ්ලා අහමඩ් රිස්වාන්**
**පාතිමා නිෆ්ලා අහමඩ්**
**පාතිමා නිෆ්ලා රිස්වාන්**
**ෆවුසි පාතිමා නිෆ්ලා අහමඩ් රිස්වාන්**
**ෆවුසි පාතිමා නිෆ්ලා අහමඩ්**
**ෆවුසි පාතිමා නිෆ්ලා රිස්වාන්**
**ලබාදිය හැකි නම : ඉහත ඉල්ලා ඇති සෑම ආකාරයටම ලබාදිය හැකිය.**

## 3. පුරවැසි සහතිකය හා ද්විත්ව පුරවැසි සහතිකය අනුව නම ලබාදීම

3.1. ඉදිරිපත් කර ඇති පුරවැසි සහතිකය හා ද්විත්ව පුරවැසි සහතිකයේ සඳහන් නම ලබා දිය හැකිය.

3.2. පුරවැසි සහතිකයේ හා ද්විත්ව පුරවැසි සහතිකයේ ඇතුලත් නමට වඩා වෙනස් නමක් ඉල්ලා සිටී නම් ඒ අනුව පුරවැසි සහතිකයේ හා ද්විත්ව පුරවැසි සහතිකයේ නම සංශෝධනය කර ඉදිරිපත් කළ යුතුය.

**උදා:- පුරවැසි සහතිකයේ සඳහන් නම : නිර්මලා ගුණසේකර**
**උප්පැන්න සහතිකයේ නම : නිර්මලා නයනකුමාරි**
**ඉල්ලන නම : නිර්මලා නයනකුමාරි ගුණසේකර**
**ඉල්ලන නම ලබාදීම සඳහා : පුරවැසි සහතිකය ඉල්ලුම් කරන නම අනුව සංශෝධනය කර ඉදිරිපත් කළ යුතුය.**



Scanned with CamScanner

3.3. පුරවැසි සහතිකයේ හෝ ද්විත්ව පුරවැසි සහතිකයේ පියාගේ නම සම්පූර්ණයෙන් සඳහන්ව ඇති විට අයදුම්කරුගේ නම සමඟ පියාගේ නම ඉල්ලන්නේ නම් ලබාදිය හැකිය.

**උදා:- පුරවැසි සහතිකයේ සඳහන් නම : නිර්මලා ගුණසේකර**
**පුරවැසි සහතිකයේ සඳහන් පියාගේ නම : අතපත්තු රාලලාගේ විමල් ගුණසේකර**
**ඉල්ලන නම : අතපත්තු රාලලාගේ නිර්මලා ගුණසේකර**
**ලබාදිය හැකි නම : අතපත්තු රාලලාගේ නිර්මලා ගුණසේකර**

3.4. පුරවැසි සහතිකයේ හෝ ද්විත්ව පුරවැසි සහතිකයේ සඳහන් නම සමඟ විවාහ සහතිකය ඉදිරිපත් කර ස්වාමියාගේ නම/වාසගම ඉල්ලන්නේ නම් ලබාදිය හැකිය.

## 4. පූජ්‍ය පක්ෂය සඳහා

4.1. බෞද්ධ භික්ෂූන් වහන්සේලා අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී උප්පැන්න සහතිකයට අමතරව බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන සාමණේර සහතිකය/ උපසම්පදා සහතිකය ඉදිරිපත් කළ යුතු අතර, බෞද්ධ භික්ෂූන් වහන්සේලා ඉල්ලා ඇති ආකාරයට නමෙහි මුලට **පූජ්‍ය** යනුවෙන් ද නමෙහි අගට **හිමි/ ස්ථවිර** යනුවෙන් ද ලබාදිය හැකිය.

4.2. බෞද්ධ භික්ෂූන් වහන්සේලා සාමණේර නමට වෙනස් නමක් උපසම්පදා වීමේදී ලබාගෙන ඇත්නම් උපසම්පදා සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු එම නම ලබාදිය හැකිය.

4.3. බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ නිකාය මාරු කිරීමත් සමඟ වෙනස් නමකට උපසම්පදා හෝ සාමණේර සහතිකය ඉදිරිපත් කරන්නේ නම් මුල් පැවිදි නිකායෙන් උපැවිදි වූ බවට උපැවිදි සහතිකයක් හෝ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සනාථ කරන ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

4.4. බෞද්ධ/ කතෝලික/ ක්‍රිස්තියානි/ හින්දු/ ඉස්ලාම් කාන්තා පූජක අයදුම්කාරිනියන් සඳහා පූජ්‍ය/ ගරු යන්න ලබාදීම සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවෙන්/ ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුවෙන්/ හින්දු කටයුතු දෙපාර්තමේන්තුවෙන්/ මුස්ලිම් කටයුතු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද පැවිදි සහතිකයේ **පූජ්‍ය/ ගරු** යන්න සඳහන් වී තිබිය යුතුය.

**උදා 1:- පැවිදි සහතිකයේ නම : පූජ්‍ය දඹගොඩ සීලරතන හිමි**
**ඉල්ලන නම : පූජ්‍ය දඹගොඩ සීලරතන හිමි**
**ලබාදිය හැකි නම : පූජ්‍ය දඹගොඩ සීලරතන හිමි**

**උදා 2:- පැවිදි සහතිකයේ නම : ගරු ජොසප් ප්‍රනාන්දු පියතුමා**
**ඉල්ලන නම : ගරු ජොසප් ප්‍රනාන්දු පියතුමා**
**ලබාදිය හැකි නම : ගරු ජොසප් ප්‍රනාන්දු පියතුමා**

**උදා 3:- පැවිදි සහතිකයේ නම : 1. පූජ්‍ය ධම්මදින්නා සිල්මාතාව**
**2. පූජ්‍ය ධම්මදින්නා සිල්මෑණියන් වහන්සේ**
**ඉල්ලන නම : පූජ්‍ය ධම්මදින්නා සිල්මාතාව**
**පූජ්‍ය ධම්මදින්නා සිල්මෑණියන් වහන්සේ**
**ලබාදිය හැකි නම : ඉහත ඉල්ලා ඇති සෑම ආකාරයටම ලබාදිය හැකිය.**

**උදා 4:- පැවිදි සහතිකයේ නම : ගරු සිසිල්ඩා අල්විස් කන්‍යා සොයුරිය**
**ඉල්ලන නම : ගරු සිසිල්ඩා අල්විස් කන්‍යා සොයුරිය**
**ලබාදිය හැකි නම : ගරු සිසිල්ඩා අල්විස් කන්‍යා සොයුරිය**



Scanned with CamScanner

## 5. උප්පැන්න සහතිකය නොමැති අයදුම්කරුවන් සඳහා නම ලබාදීම

**5.1.** උප්පැන්න සහතිකය හා අනුමාන වයස් සහතිකය නොමැති වයස අවුරුදු 40ට වැඩි අයදුම්කරුවන් සඳහා හිස් ප්‍රතිඵල ලේඛණය සමඟ උපන්දිනය සනාථ කිරීමට ලියවිලි (දරුවන්ගේ උප්පැන්න සහතිකය, විවාහ සහතිකය, වැඩිහිටි හැඳුනුම්පත, පාසැල් හැරයාමේ සහතිකය, බෞතිස්ම සහතිකය හෝ වෙනත් පිළිගත හැකි ලිඛිත සාක්ෂි) සමඟ නම උපන්දිනය නිවැරදිව සඳහන් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන්නේ නම් ඉල්ලන නම ලබාදිය හැකිය.

**5.2.** නම හා උපන්දිනය තහවුරු කිරීමට ලිඛිත සාක්ෂි නොමැති අයදුම්කරුවන් සඳහා අධිකරණ වෛද්‍ය නිළධාරි විසින් අදාල ඉල්ලුම්කරුගේ වයස සහතික කොට එම සහතිකය, නම තහවුරු කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් හා ලිඛිත සාක්ෂි නොමැති බවට ග්‍රාම නිලධාරි නිර්දේශ කරන ලද ප්‍රාදේශිය ලේකම් අනු අත්සන් කරන ලද ලිපියක් ද සහිතව ඉල්ලුම් කරන්නේ නම් ඉල්ලන නම ලබාදිය හැකිය.

## 6. දෙපාර්තමේන්තු වාර්තා අනුව නම ලබාදීම

**6.1.** අයදුම්කරුවන් උප්පැන්න සහතිකයේ නමට වඩා වෙනස් නමක් ඉල්ලා ඇති විට එකී නම දෙපාර්තමේන්තු වාර්තා වල සඳහන්ව ඇත්නම් එකී නමට අදාල හැඳුනුම්පත නිකුත් කර වසර 10 කට වඩා වැඩි නම් භාවිතා කළ බවට පිළිගත හැකි ලිඛිත සාක්ෂි සමඟ විධිමත් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන්නේ නම් එම නම ලබාදිය හැකිය. (දරුවන්ගේ උප්පැන්න සහතිකය, වැඩිහිටි හැඳුනුම්පත, බෞතිස්ම සහතිකය හා වෙනත් පිළිගත හැකි ලිඛිත සාක්ෂි)

**6.2.** දෙපාර්තමේන්තු වාර්තා අනුව (සුවිය අනුව) වෙනත් නමට ලබාගෙන ඇති නම, නමට ඉල්ලා ඇති අවස්ථා වලදී අයදුම්කරු වයස අවුරුදු 50ට වඩා වැඩි නම් හා අදාල නම භාවිතා කළ බවට පිළිගත හැකි ලිඛිත සාක්ෂි සමඟ විධිමත් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන්නේ නම් එම නම ලබාදිය හැකිය. (දරුවන්ගේ උප්පැන්න සහතිකය, වැඩිහිටි හැඳුනුම්පත, බෞතිස්ම සහතිකය, පාසැල් හැරයාමේ සහතිකය, හෝ වෙනත් පිළිගත හැකි ලිඛිත සාක්ෂි)

## 7. උප්පැන්නයේ ලිඛිත භාෂාව පදනම් කර ගනිමින් නම ලබාදීම

**7.1.** උප්පැන්න සහතිකයේ සඳහන් අකුරුවලින්ම නම ලබාදිය යුතුය.

**7.2.** උප්පැන්න සහතිකයේ සඳහන් ආකාරයට වඩා වෙනස් ආකාරයකින් නම ඉල්ලා ඇති විටදී එම නම භාවිතා කළ බවට ලිඛිත සාක්ෂි ඇත්නම් එම නම ලබාදිය හැකිය. (වලංගු ගුවන් ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය/ උපාධි සහතිකය/ පාසැල් හැරයාමේ සහතිකය)

| | |
|---|---|
| **උදා 1:- උප්පැන්න සහතිකයේ සඳහන් නම(ඉංග්‍රීසි)** | **: Kusuma Panvila** |
| **ඉල්ලන නම** | **: Kusuma Panwila** |
| **ලබාදිය හැකි නම** | **: Kusuma Panwila** |
| **උදා 2:- උප්පැන්න සහතිකයේ සඳහන් නම(ඉංග්‍රීසි )** | **: Sellamutu** |
| **ඉල්ලන නම** | **: Sellamuththu** |
| **ලබාදිය හැකි නම** | **: Sellamuththu** |



Scanned with CamScanner

උදා 3:- උප්පැන්න සහතිකයේ සඳහන් නම (සිංහල) : නිලෝගිනි

ඉල්ලන නම ඉංග්‍රීසි : Nilogini

ඉල්ලන නම දෙමළ : நிலோகினி / நிலோஜினி

ලබාදිය හැකි නම (ඉංග්‍රීසි/ දෙමළ ) : Nilogini / நிலோகினி/ நிலோஜினி

උදා 4:- උප්පැන්න සහතිකයේ සඳහන් නම (සිංහල) : ප්‍රදීප්

ඉල්ලන නම ඉංග්‍රීසි : Pradeep/ Pradip/ Pratheep/ Prathip/ Prathip/ Piradeep/ Piradip/ Piratheep/ Pirathip

ඉල්ලන නම දෙමළ : பிரதீப்

ලබාදිය හැකි නම (ඉංග්‍රීසි/ දෙමළ) : Pradeep/ Pradip/ Pratheep/ Prathip பிரதீப்

උදා 5:- උප්පැන්න සහතිකයේ සඳහන් නම (දෙමළ) : பிரதீப்

ඉල්ලන නම ඉංග්‍රීසි : Pradeep/ Pradip/ Pratheep/ Prathip/ Piradeep/ Piradip/ Piratheep/ Pirathip

ඉල්ලන නම සිංහල : පිරදීප්/ ප්‍රදීප්

ලබාදිය හැකි නම (ඉංග්‍රීසි) : Pradeep/ Pradip/ Pratheep/ Prathip Piradeep/ Piradip/ Piratheep/ Pirathip

ලබාදිය හැකි නම (සිංහල) : පිරදීප්/ ප්‍රදීප්

උදා 6:- උප්පැන්න සහතිකයේ සඳහන් නම(දෙමළ) : பாத்திமா

ඉල්ලන නම ඉංග්‍රීසි : Faththima/ Fattima/ Fathima/ Fatima

ඉල්ලන නම සිංහල : පාතිමා/ ෆාතිමා/ පාත්තිමා/ ෆාත්තිමා

ලබාදිය හැකි නම (ඉංග්‍රීසි) : Faththima/ Fattima/ Fathima/ Fatima

ලබාදිය හැකි නම (සිංහල) : පාතිමා/ ෆාතිමා/ පාත්තිමා/ ෆාත්තිමා

උදා 7:- උප්පැන්න සහතිකයේ සඳහන් නම(දෙමළ) : சரஞ்யா

ඉල්ලන නම ඉංග්‍රීසි : Sarnya / Saranja

ඉල්ලන නම සිංහල : සරංයා/ සරංජා

ලබාදිය හැකි නම (ඉංග්‍රීසි) : Sarnya/ Saranja

ලබාදිය හැකි නම (සිංහල) : සරංයා



Scanned with CamScanner

උදා 8:- උප්පැන්න සහතිකයේ සඳහන් නම(දෙමළ) : கந்தராசா

ඉල්ලන නම ඉංග්‍රීසි : Kantharasa/ Kantharaja/ Kandarasa/ Kandaraja

ඉල්ලන නම සිංහල : කන්දරාසා/ කන්දරාජා

ලබාදිය හැකි නම (ඉංග්‍රීසි) : Kantharasa/ Kantharaja/ Kandarasa/ Kandaraja

ලබාදිය හැකි නම (සිංහල) : කන්දරාසා/ කන්දරාජා

උදා 9:- උප්පැන්න සහතිකයේ සඳහන් නම සිංහල : නන්දනී

ඉල්ලන නම ඉංග්‍රීසි : Nandanee/ Nandani/ Nandanei/ Nanthanee/ Nanthani/ Nanthanei

ලබාදිය හැකි නම (ඉංග්‍රීසි) : Nandanee/ Nandani/ Nandanei/ Nanthanee/ Nanthani/ Nanthanei

ලබාදිය හැකි නම (සිංහල) : නන්දනී

ලබාදිය හැකි නම (දෙමළ) : நந்தனி/ நந்தணி

උදා 10:- උප්පැන්න සහතිකයේ සඳහන් නම (ඉංග්‍රීසි) : Mohomed

ඉල්ලන නම දෙමළ : மொஹொமட்/ மொஹொமத்/ மொஹொம்மட்/

: மொஹொம்மத்/ மஹம்மத்/ மஹம்மட்

: முகம்மது/ முஹம்மத்/ முஹம்மட்/ முகம்மட்

: முகமது/ முஹமத்/ முஹமட்/ முகமட்

ඉල්ලන නම සිංහල : මොහොමඩ්/ මොහොමද්/ මොහොම්මඩ් මොහොම්මත්

: මොහොම්මද්/ මහම්මද්/ මහම්මඩ්

: මුහම්මදු/ මුහම්මද්/ මුහම්මඩ්

: මුහමදු/ මුහමද්/ මුහමඩ්

ලබාදිය හැකි නම : දෙමළ හා සිංහල භාෂාවෙන් ඉහත නම් සියල්ල ලබාදිය හැකිය. (උප්පැන්න සහතිකයේ සඳහන් නම සිංහල හෝ දෙමළ භාෂාවෙන් සඳහන් වේ නම්, අයදුම්කරු ඉල්ලන ආකාරයෙන් ඉංග්‍රීසි නම ලබාදිය හැකිය.)



Scanned with CamScanner

උදා 11:- උප්පැන්න සහතිකයේ සදහන් නම : මුහම්මදු/ මොහොම්මඩ්/ මුහම්මද්

: முகம்மது/ மொஹொம்மட்/ முஹம்மத்

ඉල්ලන නම (ඉංග්‍රීසි) : Muhammadu/ Mohommd/ Muhammath

ලබාදිය හැකි නම (ඉංග්‍රීසි) : Muhammadu/ Mohommd/ Muhammath

ඉල්ලුම්කරුවකු ඉහත අංක 01 සිට අංක 07 දක්වා ක්‍රමවලට වඩා වෙනස්ව නම ඉල්ලුම් කර ඇති අවස්ථාවන්හිදී උප්පැන්න සහතිකයේ 13 තීරුව සංශෝධනය කර ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබාදිය යුතුය. එලෙස නීත්‍යානුකූල සංශෝධනයකින් හැර ජාතික හැඳුනුම්පත සඳහා ඇතුළත් කරන නම වරින් වර වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එසේම ඉහත සඳහන් පරිදි නම ලබා දීමේදී යම් ගැටළුකාරී තත්ත්වයක් උද්ගත වන්නේ නම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්/ නියෝජ්‍ය කොමසාරිස්/ කොමසාරිස් (මෙහෙයුම්) මගින් අවශ්‍ය උපදෙස් ලබා ගත යුතුය.

පී.ඩී. ගුණතිලක
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්

පිටපත්:

01. ලේකම්, තාක්ෂණ අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
02. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කරු.දැ.ගැ.ස.
03. විගණකාධිපති - කරු.දැ.ගැ.ස.
04. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කරු.දැ.ගැ.ස./අ.ක.ස.



Scanned with CamScanner